# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/5 – 2016 නොවැම්බර් 07 වැනි සඳුදා – 2016.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ උක්ගස්හේන (අ.ග.පි. 87) ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අංක එම්ආර්/ඒටීආර්/2015/165 සහ 2016.02.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 23.2548 ක් පමණ වන කැබලි අක්ෂර 'ඒ' වශයෙන් දක්වා ඇති ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – කම්බි අඩිය – ප්‍රමාණය: හෙක්. 23.2548 ක් පමණ**

උතුරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන විල්පිට වත්ත, බී. මාටින් හිමිකම් කියන මේෂන් ගෙදර, කළුදේවගේ වයලට් හිමිකම් කියන දෙනියාය ගෙදර, ලීලා කොඩිතුවක්කු හිමිකම් කියන පොල්හේන, අස්මගොඩ පතිරණගේ ජොසිහාමි හිමිකම් කියන කැකුලන්විලහේන, ගමගේ නිමල් හිමිකම් කියන කැකුලන්විලහේන සහ ජී. ඒ. විලියම් හිමිකම් කියන ගොරකහේන; නැගෙනහිරට: බී. මාටින් හිමිකම් කියන මේෂන් ගෙදර, කළුදේවගේ වයලට් හිමිකම් කියන දෙනියාය ගෙදර, ලීලා කොඩිතුවක්කු හිමිකම් කියන පොල්හේන, අස්මගොඩ පතිරණගේ ජොසිහාමි හිමිකම් කියන කැකුලන්විලහේන, ගමගේ නිමල් හිමිකම් කියන කැකුලන්විලහේන, ජී. ඒ. විලියම් හිමිකම් කියන ගොරකහේන, අබේසේකරගේ හේමාවතී හිමිකම් කියන ඔමාරෙහේන, ධර්මදස හිමිකම් කියන බැද්දෙ පන්සල කුට්ටිය, නල්ලපෙරුම ආරච්චිගේ සෝමදස හිමිකම් කියන බැද්දෙ පන්සල කුට්ටිය, ඒ. ආරියසේන හිමිකම් කියන වඩුහේන, මාසකෝරාළ ගුණතිලක හිමිකම් කියන වඩුහේන සහ වෙදගේ රේණුකා හිමිකම් කියන වටදෙනියවත්ත; දකුණට: අබේසේකරගේ හේමාවතී හිමිකම් කියන ඔමාරෙහේන, ධර්මදස හිමිකම් කියන බැද්දෙ පන්සල කුට්ටිය, නල්ලපෙරුම ආරච්චිගේ සෝමදස හිමිකම් කියන බැද්දෙ පන්සල කුට්ටිය, ඒ. ආරියසේන හිමිකම් කියන වඩුහේන, මාසකෝරාළ ගුණතිලක හිමිකම් කියන වඩුහේන, වෙදගේ රේණුකා හිමිකම් කියන වටදෙනියවත්ත මාර්ගය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන විල්පිටවත්ත; බටහිරට: මාර්ගය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන විල්පිටවත්ත.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4 - 3/15/2015/වීඊ/24.
2016 ඔක්තෝබර් මස 03 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 988

1A – G 24504 – 14 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.